# හොඳ සිංහල 6

**සිංහල ඉගෙන ගන්නට කැමති සැමට සන්නස සේවාවකි මේ**



**වී. ක. ධර්මබන්ධු**

සිය බසේ (සිංහලයේ) අන්ක්ත රූප නාම පද යෙදෙන අවස්ථා දෙකක් අපි පසුගිය පාඩමින් ඉගෙන ගතිමු. ඉන් මුල් අවස්ථාව

**1 වාක්‍යයක කර්ම පදය වශයෙන්**

- උගත්තු භාෂා රීතීන් සකස් කරති.
- අපි ගාය්කාවක හමු වීමු/වූමු.

**2 වැනි, සඳහා, කරා ආදී නිපාත පද ආශ්‍රිත පද**

- යම දූතයන් වැනි මිනිස්සු බිළිඳුන් මරති.
- බුදුන් වෙත ගිය පටාචාරාවෝ සැනසුම ලැබූහ.

අද අපි තෙවන අවස්ථාවෙන් අරඹමු.

**3 අනුක්ත කර්තෘ හැඟවෙන නාම පද**

- ලඳුන් බිලිඳුන් කිවිඳුන් අතින් වන වැරදි ලුහු කොට තැකීම නැණවතුන් ගේ සිරිති/සිරිතයි.
- කාන්තාවන් පවසන බසටත් සවන් දිය යුතු ය.
- දැරියක ගැයූ ගීතය සිත් සතන් පිනවීමට සමත් විය.
- ගහයන් අපට කරන ඇටිකෙහෙලක් නැතැයි සීයා කියයි.
- මා දුටු සිහිනයක සිටි මහබඹා ජරපත් බමුණකු වැනි විය.
- පියාණන් එදා දුන් ඔවා මට දැනුදු සිහි වේ.

**4 ව ධාතුවෙන් සැදුණු "වූ - වන" කෘදන්තයක් පෙරටු කොට ඇති නාම පද**

- මහ කිවියකු වූ සැමුවෙල් දිළිඳු ගැමියෙක් විය.
- නමගිය සොරකු වූ ජේම්සා ගසකින් වැටී මළේ ය.
- මහා පණ්ඩිතයකු වූ පියසෝම(යන්ගේ)ගේ දෑස් දැන් නො පෙනේ.
- රූමතියක වන කමලා දැන් ජනප්‍රිය නිළියකි.
- දෛවඥයකු වන අපේ මාමා වැඩි පුර කියන්නේ බොරු අනාවැකි ය.
- ධාවන ශූරියක වන අමරා සංගීත ගුරුවරියකි.

**5 අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා පද ආශ්‍රිත නාම පද**

- මාපියන් විරුදු වුව හොත් මේ මඟුල කළ නො හැක.
- අප දෙනො ම රට ගිය හොත් අම්මා දුක් විඳිනු ඇත.
- ඔව්න් මෙහි අවහොත් මම කියැටි (කිව යුත්ත) දනිමි.
- ගංගංවන් සිඳී ගිය හොත් සාගතයක් ඇති වීම වැලැක්විය නොහැක.
- නළු නිළියන් කැඳවුව හොත් අපේ රැස්වීමට සෙනඟ ගලා එනු ඇත.
- දරුවන් සියලු දෙනා ම පැමිණිය හොත් අපට මෙදා අවුරුදු සරු ය.

**6 කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියා අශ්‍රිත පද**

- දරුවන් සෙල්ලම් කරද්දී අපි මුහුද දෙස බලා සිටියෙමු.
- හාමුදුරුවන් බණ කියද්දී මහ වැස්සක් කඩා වැටුණේ ය.
- මැහැල්ලක බසයට නඟිද්දී පය පැටලී වැටුණා ය.
- අප කෑම කද්දී සීයා පැමිණියේ ය.
- ඇය ගී ගයන්නට සැරසෙත් ම පිරිස ඔල්වර සන් දුන්හ.
- වැසියන් කුසගින්නේ පෙළෙද්දී නායකයෝ බාල් නටති.

**7 පූර්ව ක්‍රියා හෝ භාව ක්‍රියා පද සමඟ යෙදෙන ඇත/ඇති/නැත/නැති/තිබේ යන පද සමඟ බැඳෙන නාම පද**

- අගමැතිතුමන් තව ම රැස්වීමට ලැමිණ නැත.
- මා කිසි දිනක වොඩ්කා බී නැත.
- ඇමතිවරුන් රැස්වීම් අමතනු ඇති.
- අප දඹදිව වන්දනාවේ ගොස් නැත.
- ඔව්න් අයුතු වරප්‍රසාද ලබා ගෙන ඇත/තිබේ.
- අපේ සිසු දරුවන් අද වේදිකාවේ දී සිය දස්කම් පානු ඇත.
- ඒ සිටු කුලයේ කුමරිය වී ඔබ අද මෙන් මට රිදවන්න ඇති.
- ඔබට මා අතින් එබඳු වරදක් සිදු උණේ නැතී.

**8 කර්මකාරක වාක්‍ය වල විසින් නිපාතය හා බැඳෙන නාම පද** (උක්ත රූප ගැන උගනිද්දී අප මීට අදාළ ව සමහර කරුනු සාකච්ඡා කළ බව ඔබට මතක ඇතැයි සිතමි. කර්තෘකාරක වාක්‍යයක් කර්ම කාරකයට පෙරළූ විට කර්තෘ අනුක්ත වේ)

- නයකු විසින් මීයෙක් ගිලේ/ ගිලිනු ලැබේ (නයෙක් මීයකු ගිලී)
- බල්ලකු විසින් සාවෙක් මැරිණි/මරන ලදී. (බල්ලෙක් සාවකු මැරී ය)
- මිනිස් යකුන් විසින් අහිංසත දරු පැටව් මැරෙති.
- යක් මිනිසුන් විසින් අහිංසක දරුවෝ මැරෙති.
- මිනිසකු විසින් පොල් කැඩේ/ කඩනු ලැබේ.
- ගැහැනියක විසින් දර පැළේ/ පලනු ලැබේ.

**9 සංශයාර්ථය හෝ වාර්තාර්ථය (ඇසූවක් කීම) හඟවන අන්තර් වාක්‍ය වල කර්තෘ පද**

- ගිය කල දෙදහස් පන්සිය - රජකු එතියි දියනා (බු ව 2500 දී ජයසේන නම් කුමාරයකු උපදින බවට විශ්වාසයක් පැවැතිණි. එය අනාවැකි කරුවකුගේ පුහු කියමනක් විය හැකි ය)
- ඇදුර, අප තුටු නොවෙතියි නොසිත.
- ඇදුර, අප සිප් නොදනිතියි නොසිත.

    (ඇදුර තුටු නොවෙතියි
    නොසිතප සිප් නොදනිතියි
    උණුමු වෙන සදතියි
    නොදත්තෙමු ගායනා කරතියි)

- මා තරගයෙන් දිනූ බව මා පියන් නොදනිතියි සිතමි.
- හාමුදුරුවන් බොරු නොකියතියි අපි සිතමු.
- ඔව්න් අපගේ මිතුරන් වෙතියි අපි රැවටෙනෙමු.

**10 අන්තර් වාක්‍ය වල යෙදෙන ආවා- ගියා - එනවා - යනවා වැනි කෘදන්ත පද සමඟ බැඳෙන නාම පද**

- හිවලුන් හූ කියනවා (කියනු) අපට ඇසිණි.
- ඔව්න් පන්සලට යනවා (යනු) අපි නුදුටුවෙමු.
- මා පියෝ ළමයින් ගී ගයනවා (ගයනු) අසා සිටිති.
- කොල්ලෝ, තරුනියන් ගඟට බැස නෑවා බලා සිටිය හ. කිසිවකු මගෙන් ඇසුවා නම් මම ඇත්ත හෙළි කරමි.

**ලබන කලබට**

# න/ණ ල/ළ ශ/ෂ පැටලී ගැලවෙමුද?

> කිලෝ ගණනක් බර පිත්තල අබරණ ඉවත ලා ග්රෑම් කීපයක් බර රන් අබරණින් සැරසීමට කාලය එළඹ තිබේ.

මගේ න/ණ, ල/ළ - ශ/ෂ - ෂ්ට/ෂ්ඨ - ෂ්ණ/ශ්න පිලිබඳ දූනුම මේ තැනට ඊම සඳහා අවුරුදු හැටකටත් වැඩි කාලයක් ගත වී ඇත. එහෙත් එය තවමත් අසම්පූර්ණ බවත් මගේ ඉතිරි ජීවිත කාලය තුළ දී එය සම්පූර්ණ කර ගත නොහැකි බවත් මම දනිමි. ඔබට එය එසේ නොවේවා ය් පතමි. ඒ අඩු දූනුම ලබා ගැනීමට නම් මා අනිවාර්යයෙන් ම සංස්කෘත භාෂාව උගත යුතු ය. ප්‍රතිමා/පිළිම, ප්‍රතිපත්ති/පිළිවෙත, ප්‍රතත්‍යුත්තර/පිළිතුරු යන තැන් වලත්, ෂට/කළය, ආවාට/වළ, කූඨ/කුළ, කෝටි/කෙළ යන තැන් වලත් මූර්ධජ ළ ලිවීමට හේතුව දත හැක්කේ එවිට ය. ස්වර්ණ/රන්, කර්ණ/කන්, පර්ණ/පත් වන්නේත් වර්ණ/වන්/වණ වන්නේත් කවර හෙයින්දැයි පැහැදිලි නැති වුවත් එය ද දූන ගැනීම සඳහා සංස්කෘත දූනීමක් තිබිය යුතු යයි සිතමි.

සඳලු(තල), අලුයම, අරුණලු යන තැන් වල දන්තජ ල කාරයත්, සඳ එළිය, හිරු එළිය, එළි වෙන යාමය යන තැන් වල මූර්ධජ ළ කාරයත් යෙදෙන්නේ ඇයි ද යන්නට මගේ ගුරුතුමාගෙන් පවා පැහැදිලි උත්තරයක් නොලැබිණි. අලු යම, අරුණු අලු යන දෙපදයේ අලු යන්නත් සඳ එළි, හිරු එළි යන දෙපදයේ එළි යන්නත් බිඳී ඇත්තේ සංස්කෘත ආලෝක ශබ්දයෙන් යැයි සිතමි. අලු ම ඇලි වී, ඇලි ම එලි විය හැකි ය. එහෙත් එළි යනුවෙන් දන්තජ මූර්ධජ මාරු වී ඇත. පැහැය/පාට/වන් සමාන අර්ථවත් පද ය. රන්වන් කරලින් පැසිලා, කළු වන් කළු රුවයි අපෙ ගම මදින්නා, නිල්වන් (පාටින් - වනින්) අළු ලන බෝදිය යන තැන් වල වන් පදය යෙදී ඇත්තේ දන්තජ න කාරයෙනි. සිදත් සඟරාවේ පෙරපර වණන් නිසි විදිනි ගලපනු සඳ නම්, වණ පෙරළි යන තැන් වල ඇත්තේ මූර්ධජ ණ කාරයයි. ඒ පද දෙකම බිඳී ඇත්තේ සංස්කෘත වර්ණ (පාලියෙන් වණ්ණ) ශබ්දයෙන් යයි සිතමි.

අපේ කුකුල්ලු/ කුකුල් මස් ම කුකුළෝ/කුකුළු මස් ලෙසිනුත් අපේ පෙම් රැල්ල නඟී/ හෝ ගා මූදේ රැල්ල නඟින්නේ ම පෙම් රළ/රළ නඟින්නෙ ලෙසිනුත් අපේ තොරන් රාජයා ම තොරණ් රාජයා ලෙසිනුත්, නා දල්ල ම නා දළුව ලෙසිනුත් වියත් වහරේ එයි. එහෙත් පණ්ඩිතයන් කියන්නේ භාෂාව සාමාන්‍ය මිනිසාගේ උවාරණයක්/මෙවලමක් බවයි. බෝදිය, බාගය, දනය, පලය, විබාගය, බාසාව සාමාන්‍ය මිනිසාගේ වියහාරය වුවත් පණ්ඩිතයන්ට ඒවා බෝධිය, භාගය, ධනය, ඵලය, විභාගය, භාෂාව වේ. පණ්ඩිතයන් කියන්නේ එකකි. කරන්නේ අනෙකකි.

සමහරු භාෂාව ගලන ගඟකට උපමා කරති. ගඟ මිනිසාගේ නිර්මාණයක් නොවේ. එය සොබා දහමේ නිර්මාණයකි. කන්ද, විල මෙනි. වැව, පාර මිනිසාගේ නිර්මාණ වේ. ජන ශූන්‍ය රටක වුවද ගඟක් තිබිය හැකිය. පාරක් හැදෙන්නේ මිනිස් වාසයකටය. භාෂාවක් හැදෙන්නේ මිනිසුන් අතරය. එහෙයින් මා දකින්නේ බස පාරක් ලෙසය. කරත්තයක් ගෙන යාමට පාරක් ම උවමනා නැත.වළ ගොඩැලි ගල් මුල් සහිත ඉඩමක පොල් කරත්ත යනු මම දූක ඇත්තෙමි. ඒ පෞද්ගලික ගමනකි. පොදු පාර/ පොදු බස් පාර ඊට වෙනස් ය.

වළ ගොඩැලි, ගල් මුල්, වට වංගු නැති තාර දමා සැදි පළල් පාරක ගමන් කරන වාහන වල තරම, ගෙන යන බර, ගමන් කරන වේගය ඔබ දනිති. එබඳු පාරක ගමන් කරන වාහන වල කල් පැවැත්මද හොඳය. සංස්කෘතයෙන් සහ සිංහලයෙන් ගාන්ධි ලියත හැකිය. එය දෙමළට කාන්ති වන බව කියති. ඉංගිරිසියට ගාන්ඩි ය එසේ වන්නේ ඒ බසේ හෝඩිය අනුවය. එහෙත් අපට අනුරාදපුරය, පන්ඩුකාබය. බුද්ද දර්මය ගොඩේ සිංහල ය. අලට තන කොල යන්න තේරෙන්නේ තණ කොළ යනුවෙන් ලියුව හොත් ය.

මේ දූක්වූයේ මගේ පෞද්ගලික අදහස් ය. එය වාදාභිමුඛ ව ලියූවක් නොවේ. එහෙත් ඔබට ඔබේ අදහස් දූක්විය හැකි ය.

කිලෝ ගණනක් බර පිත්තල අබරණ ඉවත ලා ග්රෑම් කීපයක් බර රන් අබරණින් ස්ැරසීමට කාලය එළඹ තිබේ.


STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243
Melbourne 03 9309 2427



Raigam
Satisfying your taste buds!
ඇයි මේ හැමෝම රයිගම් ඉල්ලන්නේ?
අපිට පුරුදු රස ගුණ හොඳින් හඳුනන රයිගම් නිශ්පාදන මිලදී ගන්න දුර ගෙවාගෙන ගරි අපි එන්නේ ඒ රයිගම් රස අපිත් හොඳින් දන්න නිසයි.
රස හඳුනන්නෝ රයිගම් ගන්නෝ
Raigam Soy, Raigam Noodles, Raigam Dehydrated Vegetables, Raigam Coffee
Raigam String Hopper Flour, Raigam Jayalanka Spice range, Raigam
NO ALTERNATIVE TO RAIGAM TASTE! IT'S IRRESISTIBLE!
For genuine export quality Raigam products, look for 'AU EXPORT' print & imported by 'E-Techno' label.
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, PO Box 87, Moone Ponds Vic 3039
Wholesale & Customer Service 03-9700 2100/93703813
රයිගම් නම් කවදත් කොතැනත් හරිම රසයි!
New Stocks Avaialable, Enquire today for your stock!
Email:sales@etechno.com.au FAX -03-9337 9468